**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය.**

**පෙර පාසල් අධ්‍යාපන උසස් සහතික පත්‍ර වැඩ සටහන**

**අවසාන පරීක්ෂණය - 2008**

**ESC 2221 - පූර්ව ළමාවිය සමායෝජී වීමේ ගැටළු**

**කාලය - පැය තුනයි.**

---

**දිනය - 2008 අගෝස්තු 29 වන දින** **වේලාව - ප.ව.01.30- ප.ව.040**

---

**ප්‍රශ්ණ හතරකට (04)පමණක් පිළිතුරු සපයන්න.**

01. i. පෙර පාසල් පංති කාමරය තුළ ඔබට නිරීක්ෂණය කළ හැකි සමායෝජී වීමේ ගැටළු පහක් (05) ලැයිස්තු ගත කරන්න.

(ලකුණු 05)

ii. ඉහත සඳහන් කළ සමායෝජී වීමේ ගැටළු ළමයෙකුගේ සමස්ත සංවර්ධනයට බලපාන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. සුදුසු උදාහරණ සඳහන් කරන්න.

(ලකුණු 20)

02. "පරිසරය විසින් ඉගෙනීමේ ක්‍රියාවලීන් මගින් චර්යාව හැඩගස්වනු ලබයි."

i. සමාජ ඉගෙනුම් න්‍යායෙහි අඩංගු ප්‍රධාන ඉගෙනීමේ ක්‍රියාවලීන් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 12)

ii. ඉහත ක්‍රියාවලීන් අතරින් එකක් තෝරාගෙන, එය මුල් ළමාවියේ සමායෝජී වීමේ ගැටළු සංවර්ධනය වීම සඳහා බලපාන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. අවම වශයෙන් සුදුසු උදාහරණ එකක් හෝ සඳහන් කරන්න.

(ලකුණු 13)

03. "ඉච්ඡාභංගත්වයට පත්වූ ළමයෙකු තෘප්තිමත් ළමයෙකුට වඩා අන් අය කෙරෙහි බෙහෙවින්ම චණ්ඩ ලෙස හැසිරීමට ඉඩ ඇත."

i. උදාහරණ දක්වමින් ඉහත ප්‍රකාශය විමසන්න.

(ලකුණු 15)

ii. පංති කාමරය තුළ ඇතිවිය හැකි චණ්ඩ චර්යා අවම කර ගැනීම සඳහා ගුරුවරියට ගත හැකි ක්‍රියාමාර්ග පහක් (05) දක්වන්න.

(ලකුණු 10)

04. "කාලයත් සමග මැකී යන නමුත් මුල් ළමාවියේ පසුවන බොහෝ ළමයින්ගේ කථනයෙහි ගොත ගැසීම සහ වික්කල් ගැසීම (starmmering and stuttering) දක්නට ලැබේ."

ගොත ගැනීම හා වික්කල් ගැසීම සමනය කර ගැනීම සඳහා ළමුන්ට උපකාර කළ හැකි ක්‍රියාකාරකමක් සංවිධානය කරන්නේ කෙසේදැයි විස්තර කරන්න. ඔබගේ විස්තරයට පහත සඳහන් දේ ඇතුළත් විය යුතුය.

i. ක්‍රියාකාරකම පිළිබඳ කෙටි විස්තරයක් (ලකුණු 05)

ii. එම ක්‍රියාකාරකම තෝරා ගැනීමට හේතු (ලකුණු08)

iii. ගුරුවරියගේ භූමිකාව සහ සිසු සහභාගීත්වය (ලකුණු 08)

iv. ඔබ භාවිතයට ගන්නා සම්පත් ලැයිස්තුවක් (ලකුණු 04)

05. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් (02) තෝරා කෙටි සටහන් ලියන්න.

i. බාල ළමයින්ගේ මනෝ සමාජීය සංවර්ධනය සඳහා රූපවාහිනියේ බලපෑම.

ii. මුල් කාලීන බැඳීම සහ ලැදි බව

iii. මූලික විශ්වාසයට එරෙහිව මූලික අවිශ්වාසය

iv. ෆ්‍රොයිඩ් විසින් හඳුන්වන ලද මනෝ ලිංගික අවදි

(ලකුණු 25)

06. i. චර්යා චිකිත්සාව හෝ චර්යා විකරණය (හැඩ ගැස්වීම) යනු කුමක්දැයි විස්තර කරන්න.

(ලකුණු 07)

ii. බාල ළමුන්ගේ චර්යා විකරණය (behaviour modification) සඳහා ත්‍යාග සහ දඬුවම් ලබාදීමේ භූමිකාව විස්තර කරන්න.

(ලකුණු 12)

iii. පංති කාමරය තුළ ගැටළු සහිත චර්යා කළමනාකරණය සඳහා ඔබ පාවිච්චි කරන දඬුවම් ක්‍රම තුනක් (03) සහ ප්‍රසාද (තිළිණ) ක්‍රම තුනක් (03) සඳහන් කරන්න.

(ලකුණු 06)

- හිමිකම් ඇවිරිණි. -